**කොලොන්නාව නගර සභාව**
**කොළඹ දිස්ත්‍රික්කය**

## 1. මූල්‍ය ප්‍රකාශන

----------------

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

--------------------------------

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 මාර්තු 06 වන දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2020 දෙසැම්බර් 07 දින හා විස්තරාත්මක කළමනාකරණ වාර්තාව 2020 දෙසැම්බර් 23 දින සභාපතිවරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

-------------------------------

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට කොලොන්නාව නගර සභාවේ මූල්‍ය තත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එම මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

---------------------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

------------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2019 වර්ෂයේදී ඉටුකිරීමට නියමිතව තිබූ නමුත් විවිධ හේතුමත අතහැර දමන ලද ඇස්තමේන්තු වටිනාකම රු.668,703 ක් වූ කර්මාන්ත 03 ක් වෙනුවෙන් ණයහිමි ප්‍රතිපාදනය කර තිබුණි. | සේවාවන් ලද පසු පමණක් ණය හිමියන් සඳහා ප්‍රතිපාදන ඇති කළ යුතු වීම. | ඉහත කර්මාන්ත 03 සඳහා ගිවිසුම් අත්සන් කර ඇති බැවින් ණයහිමි වෙන්කර ඇත. නොවැලැක්විය හැකි හේතුන් මත කර්මාන්ත 03ම ඉටු කිරීමට නොහැකි විය. ඉදිරියේදී ණයහිමි ගිණුමෙන් ඉවත් කර ගිණුම් ගලපමි. |
| (ආ) | කසළ බැහැර කිරීම වෙනුවෙන් මුතුරාජවෙල කසළ අංගනයට ප්‍රවර්ථන වර්ෂය හා පෙර වර්ෂ වෙනුවෙන් ගෙවිය යුතු රු.55,497,857 ක් සඳහා ණයහිමි ප්‍රතිපාදන සලසා නොතිබුණි. | ගෙවිය යුතු මුදල් සඳහා ණයහිමි ප්‍රතිපාදන ඇතිකළ යුතුවීම. | මෙම ගාස්තුවෙන් අප නිදහස් කර දෙන ලෙස වගකිව යුතු නිලධාරීන් දැනුවත් කිරීමෙන් අනතුරුව කසල ගාස්තු අය නොකරන ලෙස නාගරික සංවර්ධන අධිකාරියේ ලේකම් වෙත දන්වා ඇති අතර ගෙවීමට ඇති හිඟ ගාස්තුව රු.82,729,720.17+VATසිට රු.48,259,003.43 + VAT දක්වා අඩු කර ඇත. |
| (ඇ) | භෞතිකව නොපවතින වටිනාකම රු.115,000 ක් වූ ජල බවුසරයක් සහ වටිනාකම රු.137,400 ක් වූ ගලි බවුසරයක් මෝටර් රථ ගිණුමේ ඇතුළත්කර තිබුණි. | භෞතිකව නොපවතින වත්කම් ගිණුම්වලින් ඉවත්කළ යුතුවේ. | 2000 වර්ෂයේ මිලදී ගත් ජල බවුසරය හා 2004 වර්ෂයේ මිලදී ගත් ගලි බවුසරය දිරාපත් වීම නිසා ධාවනයෙන් ඉවත් කර තිබියදී 2018 වර්ෂයේ එම රථවල වැසි සහ අනෙකුත් කොටස් යොදා ගනිමින් ට්‍රේලර් වල අඩුපාඩු පිළිසකර කර ඇත. එබැවින් මෙම රථ භෞතිකව නොපවතින අතර ගිණුමෙන් ඉවත් කිරීමට කටයුතු කරමි. |

1.3.2 **නොසැසඳුනු පාලන ගිණුම්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| (අ) මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන හිඟ හිටි කුලී ගිණුමේ ශේෂය රු.4,912,694 ක් වුවත් ඊට අදාළ උපලේඛනයට අනුව ශේෂය රු.2,465,753 ක් වීම නිසා ගිණුම හා උපලේඛනය අතර රු.2,246,941 ක වෙනසක් විය. | අදාළ ශේෂවල වෙනස්කම් සසඳා ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතු වීම. | මෙම වෙනස 2018 වර්ෂය දක්වා පවතින බැවින් ඉදිරියේදී නිවැරදි කරමි. |
| (ආ) කොලොන්නාව මහජන බැංකුවේ අංක 194100173792765 දරන අක්‍රීය බැංකු ගිණුමේ මුදල් පොත අනුව බැංකු ශේෂය රු.191,320 ක් හා එදිනට බැංකු ප්‍රකාශනය අනුව ශේෂය රු.88,436ක් විය. මෙම ශේෂයන් දෙක අතර වෙනසට හේතු අනාවරණය කරගෙන තිබුණු නමුත්, මූල්‍ය ප්‍රකාශනයේ මෙම බැංකු ගිණුමට අදාළ ශේෂය රු.52,533 ක් ලෙස ගිණුම්ගත කර තිබුණි. | වෙනස්කම් සසඳා නිවැරදි ශේෂය ගිණුම් ගත කළ යුතුවේ. | කොළොන්නාව මහජන බැංකුවේ පැරණි ජංගම ගිණුමේ 2019.12.31 ට මුදල් පොතේ ශේෂය හා මූල්‍ය ප්‍රකාශන වල ශේෂය නිවැරදි කර ගැනීමට අවශ්‍ය සනාථ කිරීම් නොමැති වීම හේතුවෙන් මෙම ශේෂ නිවැරදි කිරීමට අපහසු වී ඇත. |

**1.4 අනුකූල නොවීම්**

1.4.1 **නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

නීතිරීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැ වීම |
| --- | --- | --- | --- | --- | --- |
| | නීති රීති, හා රෙගුලාසි ආදියට යොමුව | වටිනාකම | අනුකූල නොවීම් | | |
| | | රු. | | | |
| (අ) | නගර සභා ආඥා පනතේ 133 වගන්තිය | 2,411,856 | සභා බල ප්‍රදේශයේ පොදු ජලකනු වෙනුවෙන් ජාතික ජලසම්පාදන මණ්ඩලයට මාසිකව රු.200,988 බැගින් 2019 වර්ෂය සඳහා රු.2,411,856 ක ගාස්තුවක් ගෙවා තිබුණි. | ආඥා පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | නගර සභා බල ප්‍රදේශයේ ජීවත් වන පොදු මහ ජනතාවගේ යහපත උදෙසා මෙම වියදම දැරීමට සිදුව ඇත. මෙම පොදු ජල කරාම සඳහා විශාල පිරිවැයක් දැරීමට නගර සභාවට සිදුවන අතර දේශපාලන අධිකාරියෙන් මතුවන විවිධ බලපෑම් මත මෙම ජල කරාම ඉවත් කිරීමට ඇති හැකියාව සීමිත වී ඇත. |

| | | | | | |
|---|---|---|---|---|---|
| (ආ) | 1971 අංක 48 දරන පළාත් පාලන ආයතන පිළිබඳ විශේෂ විධිවිධාන පනත | 83,366,990 | වරිපනම් බදු අයකිරීම සඳහා සභා බල ප්‍රදේශයේ සියළු නිශ්චල දේපල වර්ෂ 05 කට වරක් තක්සේරු කළ යුතු වුවත් වසර 07 කට පෙර ලබාගත් තක්සේරුවක් පදනම් කරගෙන වරිපනම් බදු අයකර තිබුණි. | පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | දැනට තක්සේරු කිරීමේ කටයුතු ආදායම් පරීක්ෂකවරුන් විසින් සිදු කරමින් පවතී. නගර සභා බල ප්‍රදේශයේ කොට්ඨාශ 11 න් කොට්ඨාශ 5 ක් සඳහා නව තක්සේරුව අවසන් කර ඇත. |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 371 (5) | 2,518,134 | නිකුත් කළ අත්තිකාරම්, නිකුත් කරන ලද මුදල් වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පෙර පියවිය යුතු වුවද ප්‍රවර්ථන වර්ෂය අවසාන දිනට නොපියවූ අත්තිකාරම් ශේෂය රු.2,518,134 ක් විය. | නොපියවූ අත්තිකාරම් පියවා ගැනීමට කටයුතු කළ යුතුවීම. | රු.36,078 ක් ඩබ්.ප්‍රේමවතී මියගේ විශ්‍රාම පාරිතෝෂිකයෙන් අය කළ යුතුය. අනිකුත් නොපියවූ අත්තිකාරම් පියවීමට ඉදිරියේදි කටයුතු කරමි. |
| | වෙනත් චක්‍රලේඛ (i) 2016 නොවැම්බර් 09 දිනැති අංක LGD/13/2016 දරන පළාත් පාලන දෙපාර්තමේන්තු චක්‍රලේඛය | - | කඩකුලී තක්සේරුව වසර 3කට වරක් සිදුකර නොතිබුණි. | චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව කටයුතු කළ යුතුවීම. | වැල්ලම්පිටිය පොදු වෙළඳපලේ ගිවිසුම් යාවත්කාලීන කර ඇත. අඹතලේ පාර පුළුල් කිරීමේදී අනෙකුත් වෙළඳ ස්ථාන ඉවත් වීමට නියමිත බැවින් ගිවිසුම් යාවත්කාලීන කර නොමැත. |
| | (ii) බස්නාහිර පළාතේ 2008 අංක 01 දරන නාගරික ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ රීති 18(l) | - | පළාත් පාලන ආයතනයට ගෙවනු ලබන බදුවලට අමතරව කසළ දොරින් දොරට එකතු කිරීමේ වියදම් පියවා ගැනීම සඳහා, සභාව විසින් බලප්‍රදේශයේ පැවති නිවාස හා ව්‍යාපාරික ආයතනවලින් කසළ බදු අයකිරීමට පියවර ගෙන නොතිබුණි. | කසළ බදු අයකිරීම විධිමත් කිරීමට පියවර ගත යුතුවීම. | වරිපනම් බදු, ව්‍යාපාරික බදු, කර්මාන්ත බදු හා වෙනත් පොදු සේවා සඳහා මුදල් අය කිරීම හේතුවෙන් ව්‍යාපාරික ප්‍රජාව වෙනම කසළ බැහැරලීමට මුදලක් ගෙවීමට අකමැති විය. කර්මාන්ත ශාලා හා මධ්‍යම පන්තිය ඉක්මවූ ව්‍යාපාර වලින් මසකට කසළ ලෝඩ් 01කට රු.8000/- බැගින් මුදල් අය කරනු ලබයි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්ථන වියදම ඉක්මවූ ආදායම රු.82,914,518 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්ථන වියදම ඉක්මවූ ආදායම රු.36,798,316 ක් විය.

### 2.2 මූල්‍ය පාලනය

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම. |
|---|---|---|---|
| (අ) | ජංගම ගිණුම් අංක 194100153792766 හි 1993 වර්ෂයේ සිට පැවත එන රු.15,000ක මුදල් මාරු කිරීම් හා 1980 ඔක්තෝබර් 17 දින තැන්පත් කළ නමුත් උපලබ්ධි නොවූ රු.10,104 ක් වූ චෙක්පතක් බැංකු ප්‍රකාශනයේ ශේෂයට එකතු කිරීම් ලෙස දක්වා තිබුණු අතර එම ශේෂ නිවැරදිව හඳුනාගෙන නිරවුල් කර නොතිබුණි. | උපලබ්ධි නොවූ තැන්පත් හඳුනාගෙන සුදුසු ක්‍රියාමාර්ග ගත යුතු වීම. | නිලධාරින්ගේ ප්‍රමාද දෝෂයකින් රු.15,000 මුදල ගිණුමේ ඉදිරියට පැමිණ ඇත. මෙම මුදල සභා අනුමැතියක් මඟින් නිරවුල් කිරීමට කටයුතු කරමි. තැන්පත් කළත් උපලබ්ධි නොවූ රු.10,104 ක් වූ චෙක්පත රජයේ ආධාර ව්‍යාපෘති සඳහා ලැබී ඇත. |
| (ආ) | ජංගම ගිණුම් අංක 194100173792765 හි 2019 දෙසැම්බර් 31 දිනට බැංකු සැසඳුම් ප්‍රකාශයේ බැංකු ශේෂයට, මුදල් මාරු කිරීම්, අඩුවෙන් තැන්පත් කිරීම් හා බැංකුව විසින් වැඩියෙන් හර කිරීම් රු.103,716ක් එකතුකර තිබුණු අතර වැඩිපුර ලැබීම් රු.831ක් අඩුකර තිබුණි. ඉහත ගැලපීම් සනාථ කිරීමට සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකෙරුණි. වසර 10 කට ආසන්නව අක්‍රීයව පැවති මෙම ගිණුම පළාත් පාලන සහකාර කොමසාරිස්ගේ 2019 නොවැම්බර් 14 දිනැති ලිපිය මගින් අදාළ වෙනස්කම් මාස 06 ක් තුළ නිරවුල් කිරීමට යටත්ව ගිණුම වසා දැමීමට අනුමැතිය ලබා දී තිබුණි. | බැංකු ගිණුමේ ශේෂය හා මුදල් පොතේ ශේෂය අතර වෙනස්කම් හඳුනාගෙන නිවැරදි කිරීමට නොපමාව පියවර ගත යුතුවීම. | බැංකු සැසඳුම් ප්‍රකාශයේ වැඩිපුර ලැබීම් වශයෙන් තිබූ රු.831.18 ක් මේ වන විට ගිණුම් ගලපා නිවැරදි කර ඇති අතර රු.82,299.83 ක මුදල් මාරු කිරීම් රු.20,915.53 ක අඩුවෙන් තැන්පත් හා රු.500 ක බැංකුව විසින් වැඩිපුර හර කිරීම් නිරවුල් කිරීමට සාක්ෂි සොයා ගැනීම අපහසු බැවින් හැකිතාක් නිවැරදි කිරීමට කටයුතු කරමි. |

### 2.3 ආදායම් පරිපාලනය

#### 2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත්කර තිබූ ඇස්තමේන්තු ගත ආදායම්, බිල්කළ ආදායම්,රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | 2019 ඇස්තමේන්තු ගත ආදායම | 2019 බිල් කළ ආදායම | 2019 රැස්කළ ආදායම | 2019 දෙසැම්බර් 31දිනට මුළු හිඟය | 2018 ඇස්තමේන්තු ගත ආදායම | 2018 බිල් කළ ආදායම | 2018 රැස්කළ ආදායම | 2018 දෙසැම්බර් 31දිනට මුළු හිඟය |
|---|---|---|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) වරිපනම් හා බදු | 75,600,000 | 84,079,257 | 80,198,817 | 162,895,524 | 75,000,000 | 80,095,023 | 76,544,002 | 30,471,237 |
| (ii) කුලී | 4,437,960 | 4,437,960 | 5,348,988 | 1,267,974 | 4,499,670 | 15,437,540 | 15,238,566 | 3,370,102 |
| (iii) බලපත්‍ර ගාස්තු | 350,000 | 350,000 | 598,000 | - | 300,000 | 1,499,515 | 1,499,515 | 43,450 |
| (iv) වෙනත් ආදායම් | 4,106,030 | 4,106,030 | 4,106,030 | - | 16,740,191 | - | 16,740,191 | - |
| එකතුව | 84,493,990 | 92,973,247 | 90,251,835 | 164,163,498 | 96,539,861 | 97,032,078 | 110,022,274 | 33,884,789 |

### 2.3.2 වරිපනම් හා බදු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසාන දිනට හිඟහිටි වරිපනම් රු.31,837,340 ක් වූ අතර එයින් රු.40,000 කට වඩා වැඩි හිඟ වටිනාකමක් ඇති ශේෂ 71 කින් අයවිය යුතුව තිබූ මුදල රු.18,981,761 ක් විය. එහි ඇතුළත් රු.7,045,302 ක හිඟයෙන් කිසිදු මුදලක් 2016 වර්ෂයෙන් පසු අයකර ගෙන නොතිබුණි. | හිඟ හිට ඇති වරිපනම් අයකර ගැනීමට නොපමාව කටයුතු කළ යුතුවීම. | 2020.08.31 දිනට හිඟයෙන් අය කිරීම රු.8,422,843 ක් වන අතර එය ප්‍රතිශතයක් ලෙස සියයට 24 කි. |

### 2.3.3 කඩ කුලී

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| කඩ කාමර 12කින් සමාලෝචිත වර්ෂයට අයවිය යුතු රු.189,700කින් වර්ෂය තුළදී කිසිදු කඩ කුලියක් අය කර නොතිබුණි. | හිඟ කඩකුලී අයකර ගැනීමට කටයුතු කළ යුතුවීම. | හිඟ කුලී අයකර ගැනීම සඳහා ලිපි මගින් දැනුම් දී ඇත. |

### 2.3.4 නිවාස කුලී

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වැල්ලම්පිටිය හංදිය නිවාස 7 කින් ප්‍රවර්ථන වර්ෂය අවසාන දිනට අයවිය යුතු මුළු හිඟ කුලිය රු.337,150 ක් වූ අතර නිවාස 4 ක එකතු කුලිය වූ රු.311,650 කින් ප්‍රවර්ථන වර්ෂය තුලදී කිසිදු මුදලක් අයකර නොතිබුණි. | නොපමාව හිඟ නිවාස කුලී අයකර ගැනීමට කටයුතු කළ යුතුවීම. | හිඟ කුලී අයකර ගැනීම සඳහා ලිපි මගින් දැනුම් දී ඇත. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යසාධනය

නගර සභා ආඥා පනතේ 4 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා, සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටුකළ යුතුව තිබූ කාර්තව්‍යයන් ඉටුකිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

**අත්හැර දැමූ කර්තව්‍යයන්**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | සමාලෝචිත වර්ෂයට ඉටුකළ යුතු ඇස්තමේන්තු වටිනාකම රු.11,341,613ක් වූ කර්තව්‍යයන් 24ක් ආරම්භ නොකර අත්හැර දමා තිබුණි. | ක්‍රියාකාරී සැලැස්ම අනුව කටයුතු කළ යුතුවීම. | එම වර්ෂයේදී මහජන විරෝධතා මත කර්මාන්ත අතහැර දැමීම, දේශපාලන අධිකාරිය විසින් ක්‍රියාත්මක කරන ලද බාහිර ව්‍යාපෘතීන් සඳහා ප්‍රමුඛතාවය ලබා දීමට සිදුවූ බැවින් ප්‍රමාණවත් කාලයක් නොමැතිවීම හා භූමියේ හිමිකාරීත්වය පිළිබඳ ගැටළු එයට හේතු විය. |
| (ii) | ප්‍රවර්ථන වර්ෂයේ අයවැයෙන් පූජනීය ස්ථාන සංවර්ධනය කිරීම සඳහා රු.1,800,000 ක් හා වැඩිහිටි සුභ සාධනය සඳහා රු.100,000 ක් වෙන්කර තිබුණු නමුත් එම ව්‍යාපෘතින් ක්‍රියාත්මක කර නොතිබුණි. | සැලසුම් කර තිබෙන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුවීම. | 2020 වර්ෂයේ එම ප්‍රතිපාදනද සමඟින් පූජනීය ස්ථාන සංවර්ධනය කිරීමේ සහ වැඩිහිටි සුභ සාධක කටයුතු කිරීමට පියවර ගෙන ඇත. |

### 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| නාගහමුල්ල වෙළඳසැල් ගොඩනැගිල්ල සමුපකාර ප්‍රාදේශිකය පවත්වාගෙන යාම සඳහා ලබා දී තිබුණි. 2017 වසරේදී සමුපකාර ප්‍රාදේශිකය වසා දමා තිබුණු අතර ප්‍රවර්ථන වර්ෂය අවසාන දිනට රු.59,900 ක හිඟ කුලී අයකර ගැනීම සඳහා පියවර ගෙන නොතිබුණි. | හිඟ කුලී අයකර ගැනීමට කටයුතු කළ යුතුවීම. | සමුපකාර ප්‍රාදේශිකය නවීකරණ කටයුතු කරන අයවලුන්ට එම ස්ථානයේ රැඳී සිටීමට ඉඩ දී ඇති අතර නැවත සමුපකාර කටයුතු සිදු කරන බව සමුපකාර සමිතියේ සභාපතිතුමන් විසින් 2020.09.23 දින ලිපියකින් දන්වා ඇත. |
| සමාලෝචිත වර්ෂය තුළදී විවිධ මහජන පැමිණිලි 253 ක් ලැබී තිබුණද ක්‍රියාමාර්ග ගෙන තිබුණේ පැමිණිලි 104ක් සඳහා පමණි. | මහජන පැමිණිලි ලේඛනය යාවත්කාලීන කර අදාළ ක්‍රියාමාර්ග ගැනීමට නොපමාව කටයුතු කළ යුතුය. | පොදු මහජන පැමිණිලි සඳහා ක්‍රියාමාර්ග ගෙන ඇත. මහජන පැමිණිලි ලේඛනය අඛණ්ඩව යාවත්කාලීන කිරීමට උපදෙස් දෙන ලදි. |

## 3.3 මානව සම්පත් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2019 දෙසැම්බර් 31 දිනට අනුමත තනතුරුවල පුරප්පාඩු 09 ක් පැවතුණි. | අත්‍යවශ්‍ය පුරප්පාඩු පුරවා ගැනීමට කටයුතු කළ යුතුවීම. | අදහස් දක්වා නැත |
| (ආ) | සභාවේ ලේකම් තනතුර සඳහා පරිපාලන සේවයේ III/II තනතුරක් අනුමත වී තිබුණද කළමනාකරණ සහකාර සේවයේ අධි පන්තියේ නිලධාරිණියක් එම තනතුරෙහි රාජකාරි ඉටුකිරීම සඳහා පත්කර තිබුණු අතර ගණකාධිකාරී හා පරිපාලන නිලධාරී තනතුරුවල කළමනාකරණ සහකාර සේවයේ I පන්තියේ නිලධාරීන් රාජකාරි ඉටුකරමින් පැවතුණි. | අත්‍යවශ්‍ය පුරප්පාඩු සම්බන්ධයෙන් කටයුතු කළ යුතුවීම. | මෙම පත් කිරීමේ වගකීම රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතු වන්නේය. |
| (ඇ) | කාර්යාල කාර්ය සහායකයන් 08 දෙනෙකුට අමතරව සෞඛ්‍ය කම්කරුවන් 15 ක් හා වැඩ ක්ෂේත්‍ර කම්කරු 06 දෙනෙකු ප්‍රධාන කාර්යාලයේ කාර්යාල කටයුතු සඳහා අනුයුක්ත කර තිබුණි. | අදාළ සේවකයින් නියමිත රාජකාරි සඳහා යොදවා ගත යුතුවේ. | අනුමත කාර්ය මණ්ඩලයේ කාර්යාල කාර්ය සහායක තනතුරු එකොළහක් පැවතුන ද ප්‍රධාන කාර්යාලයේ සිටින නිලධාරීන්ගේ හා මහජන නියෝජිතයින්ගේ කටයුතුවලට සහය වීම සඳහා කාර්යාල කාර්ය සහයකයින් ප්‍රමාණවත් නොවන බැවින් මෙම සෞඛ්‍ය හා වැඩ ක්ෂේත්‍ර කම්කරුවන් ප්‍රධාන කාර්යාලයේ සේවය සඳහා අනුයුක්ත කර ඇත. |
| (ඈ) | **සේවක ණය** | | |
| | සේවය හැර ගිය හා මියගිය සේවකයින් 32 දෙනෙකුගෙන් අයවිය යුතු ණය ශේෂය රු.782,502ක් වූ අතර එයින් සේවකයින් 30 දෙනෙකුට ලබා දී තිබුණු රු.692,811 ක් වසර 5 සිට වසර 20 දක්වා කාල පරාසයක් තුළ අයවිය යුතුව තිබුණි. | නොපමාව සුදුසු පියවර ගෙන හිඟ ණය මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුවීම. | හිඟ ණය සහිත සේවකයන්ට ණය මුදල් පියවන ලෙස දැනුම් දීමට කටයුතු කරන ලදි. රු.107,180 ක ණයකරුවකුගේ උරුමක්කරුවකුගෙන් වාරික වශයෙන් අයකරනු ලැබේ. සේවය හැර ගිය සේවකයින්ගේ ණය මුදල් ඇපකරුවන්ගේ මාසික වැටුපෙන් වාරික වශයෙන් අය කරනු ලැබේ. ණය කරුවන් දෙදෙනෙකුගේ ණය මුදල් විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයෙන් අය කර ගන්නා ලද අතර සේවය හැර ගිය සේවකයෙකුගෙන් සම්පූර්ණ ණය මුදල අය කර ගැනීමට කටයුතු කරන ලදී. |

**3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | අඩු ආදායම්ලාභී පවුල්වල දරුවන් සඳහා බෙදා දීමට මිලදීගෙන තිබූ රු.229,683 ක් වූ පොත් පාර්සල් 598ක් දරුවන් අතර බෙදා නොදී 2020 අගෝස්තු 18 දින වනවිටත් ගබඩාවේ ගොඩගසා තිබුණි. | අදාළ අරමුණ ඉටුවන පරිදි කටයුතු කළ යුතුවේ. | ඔක්තෝබර් මස අවසානයට පෙර ඉතිරි පොත් කට්ටල පාසල් වෙත බෙදා දීමට කටයුතු කරමි. |
| (ආ) | 2018 වර්ෂයේදී අගලවත්ත හා වළල්ලාවිට ප්‍රාදේශීය සභාවලින් වාහන හුවමාරුවකින් ලැබී තිබුණු රු.5,900,000 ක් වූ ටිපර් රථ 02ක් 2020 අගෝස්තු 18 දින වනවිටත් පවරාගෙන නොතිබුණි. | අදාළ වාහන පවරා ගැනීමට කටයුතු කළ යුතුවීම. | අගලවත්ත ප්‍රාදේශීය සභාව මගින් හුවමාරු කරගත් LI - 6089 ටිපර් රථය හා වළල්ලාවිට ප්‍රාදේශීය සභාව මගින් ලද LL - 0018 දරන ටිපර් රථය කොළොන්නාව නගර සභාව වෙත නෛතිකව පවරා ගැනීමටත් අවශ්‍ය කටයුතු සිදු කරමි. |

**3.5 නිශ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

| විගණන නිරීක්ෂණය | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ප්‍රවර්ථන වර්ෂයේදී මිලදී ගෙන තිබුණු රු.379,500 ක් වූ කොන්ක්‍රීට් මිශ්‍රණ යන්ත්‍රයක්, රු.511,750 ක්වූ ජෙනරේටරය සහ ෆ්ලෑෂ් ලයිට් 04 ක් භාවිතයට නොගෙන 2020 අගෝස්තු 18 වන විටත් ගබඩාවේ නිශ්ක්‍රීයව තබා තිබුණි. | අදාළ යන්ත්‍ර කාර්යක්ෂමව මෙහෙයුම් කටයුතු සඳහා යොදා ගත යුතුවීම. | මාර්ග නඩත්තුව දිවා කාලයේ කළ නොහැකි අවස්ථාවල භාවිතයට ගනු ලැබේ. මෙම යන්ත්‍ර ප්‍රාග්ධන වත්කම් වන අතර ඉදිරියේදී මිලදී ගැනීමට අධික වැය දැරීමට සිදුවන හෙයින් සභාවට පාඩුවක් නොවේ. ඵලදායීව උපයෝජනය කිරීමට වග බලා ගනිමි. |
| (ආ) | රු.1,516,250 ක් වටිනා ට්‍රැක්ටර් 03ක් හා වටිනාකම සොයාගත නොහැකි ට්‍රැක්ටර් 02 ක් නගර සභා භූමියේ දිරාපත් වෙමින් පැවති අතර මෙම වාහන අළුත්වැඩියා කර ප්‍රයෝජනයට ගැනීමට හෝ අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි. | නොපමාව අපහරණය කිරීමට කටයුතු කළ යුතුවීම. | මූල්‍ය චක්‍රලේඛ 09/2015 අනුව රාජ්‍ය ආයතන සතු වසර 10 ක් ඉක්මවූ අක්‍රිය තත්ත්වයේ ඇති වාහන අපහරණය කළ යුතුව ඇති අතර ඒ අනුව සභාවෙහි අවු.30 ත් 10 ත් අතර ඇති වාහන පිළිබඳ වාර්තාවක් සකසා 2020.07.16 දිනැති මාසික මහ සභාව වෙත ඉදිරිපත් කර වාහන අපහරණය කිරීමට මහ සභාවෙහි අනුමැතිය ලබා ගන්නා ලදි. ඒ අනුව මෙම වාහන අපහරණ මේ වන විට සිදු කරමින් පවතී. |

## 3.6 ප්‍රසම්පාදනය

## 3.6.1 ප්‍රසම්පාදන සැලැස්ම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1(අ) ප්‍රකාරව අවම වශයෙන් වසර 03 ක කාලයක් සඳහා අපේක්ෂිත ප්‍රසම්පාදන කටයුතු ඇතුළත් කර ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | නොපමාව ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කළ යුතුවීම. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4:2 (අ) ප්‍රකාරව වසර තුනක කාලයක් සඳහා අපේක්ෂිත ප්‍රසම්පාදන කටයුතු ඇතුළත් කර ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල නොකරන අතර නගර සභාවේ වාර්ෂික අයවැය පිළියෙල කිරීමේදී ප්‍රසම්පාදන යෝජනා ලබාගෙන ඒ අනුව වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම සිදුවේ. |